*සැ.යු.*: 2025.09.04 දින පළ කරන ලද අංක 2453 *ගැසට්* පත්‍රයේ IV(අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,454 - 2025 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා - 2025.09.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශය ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... ... ... | |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... ... | 978 |
| මිල පාලන දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... ... | 980 |
| නැවියන්ට දැන්වීම් ... ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළ කිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ඔක්තෝබර් මස 03 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 සැප්තැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ.බ.*).

2025 ජූනි මස 09 වැනි දින ,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

977 - B 82718 - 755 (2025/09)
E - 01

## රජයේ නිවේදන

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කොත්මලේ බටහිර**

කොත්මලේ මොරපේ ශ්‍රී කතරගම දේවාලයේ පෙරහැර මංගල්‍යය - 2025 වර්ෂය

**සියලු දෙනාගේ දැනගැනීම පිණිසයි**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයන්ට අනුව, අංක 1564 - 2008 අගෝස්තු මස 22 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් කොත්මලේ මොරපේ, ශ්‍රී කතරගම දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

02. එකී නියෝග ප්‍රකාරව, 2025 වසරට අදාළව කොත්මලේ, මොරපේ, ශ්‍රී කතරගම දේවාල පෙරහැර මංගල්‍යය.

- 2025.09.21 දින පිරිත් සජ්ඣායනය.
- 2025.09.22 දින සිට 2025.09.26 දින දක්වා ඇතුල් පෙරහැර.
- 2025.09.27 දින සිට 2025.10.01 දින දක්වා කුඹල් පෙරහැර.
- 2025.10.02 දින සිට 2025.10.06 දින දක්වා රන්දෝලි පෙරහැර.
- 2025.10.07 දවල් පෙරහැර.

ලෙස පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

එච්. එම්. එස්. කේ. කේ. හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
කොත්මලේ බටහිර.

09-64

---

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ගඟ ඉහළ කෝරළේ**

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් 175 වැනි අධිකාරිය වූ වන්දනා ගමන් ආඥාපනතේ 02 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝගයන්ට අනුව, 2009 මැයි මස 07 දිනැති රජයේ *ගැසට් පත්‍රය* මගින් ගම්පොල ඓතිහාසික ශ්‍රී මහා කතරගම දේවාල පෙරහැර *ගැසට්* කරන ලද පෙරහැරක් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. එකී ප්‍රකාරව 2025 වර්ෂයට අදාළව ගම්පොල වල්ලහගොඩ ශ්‍රී මහා කතරගම දේවාල පෙරහැර 2025.08.30 වැනි දින සිට 2025.09.14 වැනි දින දක්වා පැවැත්වෙන බව සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් නිවේදනය කරමි.

02. ඒ අනුව 2025 වර්ෂයේ පෙරහැර මංගල්‍යය පහත සඳහන් පරිදි පැවැත් වීමට කටයුතු සූදානම් කර ඇති බව දන්වා තිබේ.

- ඇතුල් පෙරහැර
  2025.08.30 වැනි සෙනසුරාදා දින
  2025.08.31 වැනි ඉරිදා දින
  2025.09.01 වැනි සඳුදා දින
  2025.09.02 වැනි අඟහරුවාදා දින
  2025.09.03 වැනි බදාදා දින

- කුඹල් පෙරහැර
  2025.09.04 වැනි බ්‍රහස්පතින්දා දින
  2025.09.05 වැනි සිකුරාදා දින
  2025.09.06 වැනි සෙනසුරාදා දින
  2025.09.07 වැනි ඉරිදා දින
  2025.09.08 වැනි සඳුදා දින

- රන්දෝලි පෙරහැර
  2025.09.09 වැනි අඟහරුවාදා දින
  2025.09.10 වැනි බදාදා දින
  2025.09.11 වැනි බ්‍රහස්පතින්දා දින
  2025.09.12 වැනි සිකුරාදා දින

- මහ රන්දෝලි පෙරහැර
  2025.09.13 වැනි සෙනසුරාදා දින

- දහවල් පෙරහැර
  2025.09.14 වැනි ඉරිදා දින අපරභාග 01.36 ට දකුණු දිශාභිමුඛව බෝතලාපිටිය පුරාණ විහාරයෙන් පිටත්ව අපරභාග 4.24 ට දකුණු දිශාභිමුඛව පෙරහැර ගෙවැදීමෙන් ඇසළ මංගල්‍යය හමාර කරනු ලබයි.

එස්. එම්. සී. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ.

දුරකතන අංක 081-2352604
ෆැක්ස් අංක - 081-2352604
ඊමේල් - gangaihala@gmail.com

09-129

---

**පෝරතීවුපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

වන්දනා ගමන් ආඥාපනත

**මණ්ඩූර් ශ්‍රී කන්ධසුවාමි කෝවිල් උත්සවය - 2025 වර්ෂය**

යථෝක්ත උත්සවය 2025 අගෝස්තු මස 18 වැනි දින ආරම්භ කර 2025 සැප්තැම්බර් මස 07 වැනි දින දක්වා පවත්වන මෙම උත්සවයට වන්දනා ගමන සඳහා පැමිණෙන අයගේ සහ අනෙකුත් සියලු දෙනාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

1946.08.02 වැනි දින අංක 9588 දරන ආණ්ඩුවේ *ගැසට්* නිවේදනයේ සඳහන් නිත්‍ය නියෝගයන් කෙරෙහි මෙම උත්සව සමයේ දී උත්සවයට පැමිණෙන සියල්ලන්ගේ සහ අනෙකුත් අයගේ අවධානය තකා මෙයින් යොමු කරමි.

එස්. රන්ගනාතන්,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
පෝරතීවුපත්තු,
වෙල්ලාවෙලි.

09 - 130

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන පනතින් හා 2000 අංක 54 දරන පනතින් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම.

2023.12.18 දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ඒ. එස්. අනුරාධා විසින් සහතික කරන ලද 2019.01.29 දිනැති අංක 540 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත 2023.11.14 දිනය තෙක් මුල් මුදල හා පොළිය වශයෙන් රු. 13,689,021.49 ක (රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ අසූනව දහස් විසිඑකයි ශත හතළිස් නවයක්) මුදලක් සමග රු. 9,428,884.78 ක (රුපියල් අනූ හතර ලක්ෂ විසිඅට දහස් අටසිය අසූ හතරයි ශත හැත්තෑ අටක්) මත වසරකට සියයට දහතුනක් (13%) බැගින් 2023.11.15 දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද ඉඹුල්ගොඩ, පරකන්දෙනිය, අංක 311 හි ජයවීර ආරච්චිගේ කුවේර කිත්සිරි රණසිංහ මහතා වෙතින් අය විය යුතුව ඇත.

2. එකී 2019.01.29 දිනැති අංක 540 දරන උකස් බැඳුම්කරය අනුව ණය මත රු. 13,689,021.49 ක (රුපියල් එක්කෝටි තිස්හය ලක්ෂ අසූනව දහස් විසිඑකයි ශත හතළිස් නවයක්) මුදලක් ද 2023.11.15 දින සිට විකිණීමේ දිනය තෙක් එකී පරිදි පොළිය ද ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3, M/s T&H ඔක්ෂන් හි වෙන්දේසිකාර M. H. T. කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද ලංකා බැංකු ආඥාපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළකිරීමට ලංකා බැංකුවේ කිරිබත්ගොඩ අධිශ්‍රේණි ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාර හට ද මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ගම්පහ මහ නගර සභා සීමාවේ අංක 237B , කොස්සින්න බටහිර 11 ග්‍රාම නිලධාරි කොට්ඨාසයෙහි කොස්සින්න ග්‍රාමයේ පිහිටි "මුණමල්ගහවත්ත සහ ලාවුලුගහවත්ත" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. පී. එන්. සඳගිරි විසින් සාදන ලද 2018.08.13 දිනැති අංක 3785 දරන පිඹුරේ ලොට් 1 ලෙස ලකුණු කර මායිම් නිරූපණය කළ බෙදන ලද්දා වූ විස්තර කළ එකී ලොට් 1 හි මායිම් නම් : උතුරට : ප්‍රාදේශීය සභා පාර ද; නැගෙනහිරට : ප්‍රාදේශීය සභා පාර සහ හපුආරච්චිගේ චන්ද්‍රසෝම ජයවර්ධන හිමිකම් කියන ඉඩම ද; දකුණට : ලොට් 2 සහ හපුආරච්චිගේ චන්ද්‍රසෝම ජයවර්ධන හිමිකම් කියන ඉඩම ද; බස්නාහිරට : එකී අංක 4233 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 ද මායිම්ව රූඩ් එකයි පර්චස් දහයයි දශම පහයි බිංදුවක් (රූ.1, පර්. 10.50) බිම් ප්‍රමාණයකින් යුත් ඉඩම සමග එහි පිහිටි පස්, ගස්, ගොඩනැගිලි, වැවිලි ඇතුළු සියලු දේ සමග වේ. මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ P 647/40 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. එල්. එස්. එස්. හේරත්,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිනි.

ලංකා බැංකුව,
අධිශ්‍රේණි ශාඛාව,
කිරිබත්ගොඩ.

09 - 72

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - නාරාහේන්පිට ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්. සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 2326831, 2326836, 2327652, 2327657, 2331843, 2331847, 2331854, 2331855, 2335402, 2338453, 2345001, 2346758, 2358275, 2364086, 2366884, 2368920, 2372189, 2372191, 2374632, 2377293, 2379531, 2382730, 2448006 සහ 2450868.

ජංගම ගිණුම් අංක : 1220026626

බෙවේරියන් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2025 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. එන්. පී. පෙරේරා විසින් 2011 ජූලි මස 18 වැනි දින සහතික කරන ලද අංක 1547, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2013 පෙබරවාරි මස 12 වැනි දින සහතික කරන ලද අංක 2133, 2014 ජූලි 21 වැනි දින සහතික කරන ලද අංක 2456, 2016 ජූලි මස 14 වැනි දින සහතික කරන ලද අංක 3072, 2017 මැයි මස 25 වැනි දින සහතික කරන ලද අංක 3318 සහ 2018 ජූනි මස 29 වැනි දින සහතික කරන ලද අංක 3617 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය (සහ/ හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන ලියාපදිංචි අංක PV 73897 දරන, බෙවේරියන් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් (දැන් මියගොස් සිටින) උකස්කරු හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී බැංකු පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී බෙවේරියන් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ/හෝ ජිහාන් ෂිහාබ්දීන් (මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ණය අය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වන වගන්තිය ප්‍රකාරව කොළඹ දිසා අධිකරණයේ අංක DSP 235/2024 නඩුවෙන් පත් කරන ලද නීත්‍යානුකූල නියෝජිත ලෙස) පැහැර හැර ඇති හෙයින්;

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. පී. හීන්කෙන්දේ විසින් 2013 සැප්තැම්බර් මස 30 වැනි දින සහතික කරන ලද අංක 382, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2014 ජූලි මස 21 වැනි දින සහතික කරන ලද අංක 2455 සහ 2016 මාර්තු මස 10 වැනි දින සහතික කරන ලද අංක 2976 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති ඉහත කී බෙවේරියන් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ එකී මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් සහ ජිහාන් ෂිහාබ්දීන් උකස්කරුවන් හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී බැංකු පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී බෙවේරියන් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ/හෝ එකී ජිහාන් ෂිහාබ්දීන් (මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ණය අය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 7(2) වන වගන්තිය ප්‍රකාරව කොළඹ දිසා අධිකරණයේ අංක DSP 235/2024 නඩුවෙන් පත් කරන ලද උකස්කරු ලෙස සහ නීත්‍යානුකූල නියෝජිත ලෙස) පැහැර හැර ඇති හෙයින්,

සහ මෙහි පහත සහ දැන් එහෙයින් පෙන්වන පරිදි, එකී උකස් බැඳුම්කරයන් යටතේ ජංගම ගිණුම් අංක 1220026626 මත අයිරාව සහ කාලීන ණය අංක 2326831, 2326836, 2327652, 2327657, 2331843, 2331847, 2331854, 2331855, 2335402, 2338453, 2345001, 2346758, 2358275, 2364086, 2366884, 2368920, 2372189, 2372191, 2374632, 2377293, 2379531, 2382730, 2448006 සහ 2450868 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන් වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හත්සිය අනූ හතයි හය ලක්ෂ තිස් හය දහස් හයසිය පහළොවයි ශත විසි තුනක (රු. 797,636,615.23) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හත්සිය අනූ හතයි හය ලක්ෂ තිස් හය දහස් හයසිය පහළොවයි ශත විසි තුනක (රු. 797,636,615.23) මුදල අය කර ගැනීම සඳහා පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ ද යම් මුදලක් වේ නම් ඒවා ද, අඩුකොට එකී අංක 1547, 2133, 2456, 3072, 3318, 3617, 382, 2455 සහ 2976 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත පළමුවන සහ දෙවන උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම හා පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරච්චාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) ජංගම ගිණුම් අංක 1220026626 මත අයිරා පහසුකම සඳහා 2023 ජූලි මස 4 වැනි දින දක්වා රු. 131,405,778.95 ක මුදලක් සහ 2023 ජූලි මස 05 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 131,405,778.95 ක එකී මුදල මත වර්ෂයකට 24.00% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(b) කාලීන ණය අංක 2326831 සඳහා රු. 10,536,568.22ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,421,514.65 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(c) කාලීන ණය අංක 2326836 සඳහා රු. 15,139,944.47 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,227,040.78 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(d) කාලීන ණය අංක 2327652 සඳහා රු. 32,262,872.76 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 19,710,500.19 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(e) කාලීන ණය අංක 2327657 සඳහා රු. 10,555,994.44 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,433,353.05 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(f) කාලීන ණය අංක 2331843 සඳහා රු. 10,586,715.15 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,452,080.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(g) කාලීන ණය අංක 2331847 සඳහා රු. 10,493,851.48 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,395,483.42 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(h) කාලීන ණය අංක 2331854 සඳහා රු. 10,494,699.20 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,395,998.86 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(i) කාලීන ණය අංක 2331855 සඳහා රු. 10,493,851.48 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 6,395,483.42 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(j) කාලීන ණය අංක 2335402 සඳහා රු. 33,147,686.48 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,201,860.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(k) කාලීන ණය අංක 2338453 සඳහා රු. 41,563,036.19 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 25,330,600.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(I) කාලීන ණය අංක 2345001 සඳහා රු. 16,468,415.29 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,036,680.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(m) කාලීන ණය අංක 2346758 සඳහා රු. 16,476,665.68 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,041,705.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(n) කාලීන ණය අංක 2358275 සඳහා රු. 41,020,585.62 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 25,000,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(o) කාලීන ණය අංක 2364086 සඳහා රු. 27,565,826.87 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 16,800,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(p) කාලීන ණය අංක 2366884 සඳහා රු. 16,493,025.49 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,051,680.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(q) කාලීන ණය අංක 2368920 සඳහා රු. 33,002,551.77 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,113.410.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(r) කාලීන ණය අංක 2372189 සඳහා රු. 41,020,585.63 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 25,000,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(s) කාලීන ණය අංක 2372191 සඳහා රු. 20,510,292.81 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,500,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(t) කාලීන ණය අංක 2374632 සඳහා රු. 14,883,052.43 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 91,534,679.19 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 14.00% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(u) කාලීන ණය අංක 2377293 සඳහා රු. 33,011,361.53 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,118,782.10 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(v) කාලීන ණය අංක 2379531 සඳහා රු. 37,246,688.51 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 22,700,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(w) කාලීන ණය අංක 2382730 සඳහා රු. 32,996,627.31 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,127,390.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(x) කාලීන ණය අංක 2448006 සඳහා රු. 8,888,159.30 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,416,893.30 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; සහ

(y) කාලීන ණය අංක 2450868 සඳහා රු. 9,371,778.17 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 5,711,635.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; වේ.

**පළමුවැනි උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමා ඇතුළත මහනුවර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය වීදියේ (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) අංක 371, 371A සහ 371B දරන ස්ථානයේ පිහිටි ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. ඒ. ද ජේ. සෙනවිරත්න විසින් 2011.04.22 වැනි දින පිළියෙල කරන ලද අංක 1046 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 373 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : ත්‍රිකුණාමලය වීදිය මගින් ද; දකුණට : වරිපනම් අංක 369 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : යාබද දුම්රිය ඉඩමේ කාණුව මගින් ද මායිම් වූ එකී අංක 1046 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහක (රූ.1, පර්. 5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ලොට් 1 පහත විස්තර කරන ලද ඉඩමේ නැවත මැනීමක් වේ.

ඉහත කී ත්‍රිකුණාමලය වීදියේ (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) පිහිටි ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු එච්. ඩී. ජී. කේ. පී. රොද්‍රිගෝ විසින් 1984.03.20 වැනි දින පිළියෙළ කරන ලද අංක 1492 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද එකී ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 373 දරන පරිශ්‍රය (වරිපනම් අංක 373 දරන පරිශ්‍රය සහ පොදු පාර ලෙස කලින් විස්තර කරන ලද) මගින් ද; නැගෙනහිරට : ත්‍රිකුණාමලය වීදිය (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) මගින් ද, දකුණට : වරිපනම් අංක 369 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : යාබද දුම්රිය ඉඩමේ කාණුව මගින් ද මායිම් වූ එකී අංක 1492 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහක (රූ.1, පර්. 5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරුව A 365/242 යටතේ ලියාපදිංචි කර ඇත.

### දෙවන උපලේඛනය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ. පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 40 තුළ, තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. විජයරත්නම් විසින් 1976.02.29 වැනි දින පිළියෙල කරන ලද අංක 9/1976 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A2 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A2 සහ ලොට් C මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයක (පර්. 6) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරුව E 36/120 යටතේ ලියාපදිංචි කර ඇත.

වඩා මෑත නැවත මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර වේ.

ඉහත කී පිටත ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 (කොටස) දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් 2013.08.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3314 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : මෙහි ලොට් Y මගින් ද සහ බස්නාහිරට: මෙහි ලොට් Y සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C (පාර) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් හයක (පර්. 6) *හෙවත්* හෙක්ටෙයාර් 0.015176ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ. පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 40 තුළ, තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. විජයරත්නම් විසින් 1976.02.29 වැනි දින පිළියෙල කරන ලද අංක 9/1976 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්: උතුරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A1 මගින් ද; නැගෙනහිරට : ලොට් A1 සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි පහක (පර්. 17.65) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරුව E 36/121 යටතේ ලියාපදිංචි කර ඇත.

වඩා මෑත නැවත මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර වේ.

ඉහත කී පිටත ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 (කොටස) දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් 2013.08.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3314 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් Y වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් X මගින් ද; නැගෙනහිරට : මෙහි ලොට් X සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C(පාර) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි පහක (පර්. 17.65) *හෙවත්* හෙක්ටෙයාර් 0.044642 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

පහත දැක්වෙන පාර මතින් මාර්ග අයිතිය සමග වේ.

ඉහත කී කොළඹ දිස්ත්‍රික්කයේ, මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය පිහිටි තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 31 දරන ස්ථානයේ ඉඩමේ කොටසක් වන ඉහත කී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C වශයෙන් දැක්වෙන එකී ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව මගින් ද; නැගෙනහිරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A1 සහ A2 මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : ඩී. එස්. ෆොන්සේකා පාර මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහයි දශම දෙකයි බිංදුව (පර්. 5.20)ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 36/122 යටතේ ලියාපදිංචි කර ඇත.

2025 ජූලි මස 30 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

09-102

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - නාරාහේන්පිට ශාඛාව**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි (ලියාපදිංචි අංකය පී.කිව්. 116 අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව.

ණය ගිණුම් අංක : 2239178, 2330915, 2330917, 2358882, 2372324, 2372327, 2376456, 2377295, 2383945 සහ 2389693.

ජංගම ගිණුම් අංකය : 1220033800.

එක්සොටික් කාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2025 ජූලි මස 30 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2014 ජූලි මස 21 වැනි දින සහතික කරන ලද අංක 2457 සහ 2016 ජූලි මස 14 වැනි දින සහතික කරන ලද අංක 3073 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය (සහ/මෙහි මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛනයේ) උකස් කොට බැඳ දමා ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නිසි පරිදි සංස්ථාපිත සමාගමක් වන ලියාපදිංචි අංක PV 77201 දරන, එක්සොටික් කාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් (දැන් මියගොස් සිටින) උකස්කරු හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී බැංකු පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී එක්සොටික් කාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ/හෝ ජිහාන් ෂිහාබ්දීන් (මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ණය අය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වන වගන්තිය ප්‍රකාරව කොළඹ දිසා අධිකරණයේ අංක DSP 236/2024 නඩුවෙන් පත් කරන ලද නීත්‍යානුකූල නියෝජනය ලෙස) පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. පී. එස්. ජයවීර විසින් 2013 නොවැම්බර් මස 04 වැනි දින සහතික කරන ලද අංක 2280, 2018 මාර්තු මස 20 වැනි දින සහතික කරන ලද අංක 3537 සහ 2018 ජුනි මස 29 වැනි දින සහතික කරන ලද අංක 3618 දරන උකස් බැඳුම්කරයන් මගින් මෙහි පහත දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම හා පරිශ්‍රය (සහ/හෝ මින්මතු සඳහන් කරන උකස් බැඳුම්කරයන්හි උපලේඛණයේ) උකස් කොට බැඳ දමා ඇති ඉහත කී එක්සොටික් කාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ණයකරු හැටියට සහ එකී මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් සහ ජිහාන් ෂිහාබ්දීන් උකස්කරුවන් හැටියට සහ වෙනත් කරුණු අතර, ඉහත කී බැංකු පහසුකම් නැවත ගෙවීම සඳහා ඇපයක් වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද එකී උකස් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම එකී එක්සොටික් කාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ/හෝ එකී ජිහාන් ෂිහාබ්දීන් (මියගිය ෂාහුල් හමීඩ් මොහමඩ් රිෂාඩ් යන අයගේ බූදලය නියෝජනය කිරීම සඳහා 1990 අංක 4 දරන බැංකු මගින් ණය අය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 7(2) වන වගන්තිය ප්‍රකාරව කොළඹ දිසා අධිකරණයේ අංක DSP 236/2024 නඩුවෙන් පත් කරන ලද උකස්කරු ලෙස සහ නීත්‍යානුකූල නියෝජිත ලෙස) පැහැර හැර ඇති හෙයින්,

සහ මෙහි පහත දැන් එහෙයින් පෙන්වන පරිදි, එකී උකස් බැඳුම්කරයන් යටතේ ජංගම ගිණුම් අංක 1220033800 මත අයිරාව සම්බන්ධයෙන් දිය යුතු කොටසක් සහ කාලීන ණය අංක 2239178, 2330915, 2330917, 2358882, 2372324, 2372327, 2376456, 2377295, 2383945 සහ 2389693 සම්බන්ධයෙන් මුල් මුදල සහ පොළිය වශයෙන් වෙනත් කරුණු අතර, රුපියල් මිලියන හාරසිය හැට පහයි එක් ලක්ෂ විසි නව දහස් හයසිය හතළිස් තුනයි ශත අනූ හතක (රු. 465,129,643.97) මුදලක් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට දැන් අය විය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන හාරසිය හැට පහයි එක් ලක්ෂ විසි නව දහස් හයසිය හතළිස් තුනයි ශත අනූ හතක

(රු. 465,129,643.97)මුදල අයකර ගැනීම සඳහා පහත විස්තර කරන ලද පරිදි, වැඩිදුර වාර්ෂික පොළිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ ද යම් මුදලක් වේ නම් ඒවා ද, අඩුකොට එකී අංක 2457, 3073, 2280, 3537 සහ 3618 දරන උකස් බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස්කොට ඇත්තා වූ ද මෙහි පහත පළමුවන සහ දෙවන, උපලේඛනයන්හි සවිස්තරව විස්තර කොට ඇත්තා වූ ද ඉඩම් හා පරිශ්‍රය කොළඹ 08, බොරැල්ල, පෙලෙන්ගස්තුඩුව පාරේ, අංක 109/21 දරන ස්ථානයේ අරව්වාවල සුසිලා කුමාරි යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

(a) කාලීන ණය අංක 2239178 සඳහා රු. 136,335,095.37 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 87,469,592.18 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට 12.75% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(b) කාලීන ණය අංක 2330915 සඳහා රු. 16,493,490.16 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,051,960.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(c) කාලීන ණය අංක 2330917 සඳහා රු. 19,849,362.57 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 12,097,195.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(d) කාලීන ණය අංක 2358882 සඳහා රු. 16,468,415.29 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,036,680.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(e) කාලීන ණය අංක 2372324 සඳහා රු. 14,767,242.09 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 8,999,900.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(f) කාලීන ණය අංක 2372327 සඳහා රු. 32,816,470.75 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 20,000,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(g) කාලීන ණය අංක 2376456 සඳහා රු. 40,878,640.42 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 25,000,000.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(h) කාලීන ණය අංක 2377295 සඳහා රු. 16,449,927.84 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,063,695.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(i) කාලීන ණය අංක 2383945 සඳහා රු. 16,485,707.73 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,063,695.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්;

(j) කාලීන ණය අංක 2389693 සඳහා රු. 16,426,678.93 ක මුළු මුදලක් (2024 අප්‍රේල් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය) සහ 2024 අප්‍රේල් මස 03 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 10,058,670.00 ක ඉතුරු මුල් මුදල මත වර්ෂයකට PLR අගය + 1.00% බැගින් වූ (2024.04.02 දින වන විට වර්ෂයකට 11.69% බැගින්) වැඩිදුර වාර්ෂික පොළියක් සමගින්; සහ

(k) ජංගම ගිණුම් අංක 1220033800 මත අයිරා පහසුකම සඳහා රු. 138,158,612.82 ක මුදලක් දිය යුතු කොටසක් සහ 2024

මාර්තු මස 29 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 138,158,612.82 ක එකී මුදල මත වර්ෂයකට 24.00% බැගින් වූ වැඩිදුර වාර්ෂික පොළියක් සමගින් වේ.

**පළමු උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමා ඇතුළත මහනුවර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ සහ මහනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ත්‍රිකුණාමලය වීදියේ (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) අංක 371, 371A සහ 371B දරන ස්ථානයේ පිහිටි ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු ජේ. ආර්. ඒ. ද ජේ. සෙනවිරත්න විසින් 2011.04.22 වැනි දින පිළියෙල කරන ලද අංක 1046 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 373 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : ත්‍රිකුණාමලය වීදිය මගින් ද; දකුණට : වරිපනම් අංක 369 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : යාබද දුම්රිය ඉඩමේ කාණුව මගින් ද මායිම් වූ එකී අංක 1046 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහක (රූ.1, පර්. 5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

එකී ලොට් 1 පහත විස්තර කරන ලද ඉඩමේ නැවත මැනීමක් වේ -

ඉහත කී ත්‍රිකුණාමලය වීදියේ (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) පිහිටි ඉඩම් කොටසට බලයලත් මිනින්දෝරු එච්. ඩී. ජී. කේ. පී. රොද්‍රිගෝ විසින් 1984.03.20 වැනි දින පිළියෙළ කරන ලද අංක 1492 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද එකී ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වරිපනම් අංක 373 දරන පරිශ්‍රය (වරිපනම් අංක 373 දරන පරිශ්‍රය සහ පොදු පාර ලෙස කළින් විස්තර කරන ලද) මගින් ද; නැගෙනහිරට : ත්‍රිකුණාමලය වීදිය (වර්තමානයේ ඩී. එස්. සේනානායක වීදිය ලෙස හැඳින්වෙන) මගින් ද; දකුණට : වරිපනම් අංක 369 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : යාබද දුම්රිය ඉඩමේ කාණුව මගින් ද මායිම් වූ එකී අංක 1492 දරන පිඹුර ප්‍රකාරව රූඩ් එකයි පර්චස් පහක (රූ.1, පර්. 5) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව A 365/242 යටතේ ලියාපදිංචි කර ඇත.

**දෙවන උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ. පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාවත්ත ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 40 තුළ, තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. විජයරත්නම් විසින් 1976.02.29 වැනි දින පිළියෙල කරන ලද අංක 9/1976 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A1 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A2 මගින් ද සහ බස්නාහිරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A2 සහ ලොට් C මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් හයක (පර්. 6) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව E 36/120 යටතේ ලියාපදිංචි කර ඇත.

වඩා මෑත නැවත මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර වේ -

ඉහත කී පිටත ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 (කොටස) දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් 2013.08.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3314 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් X වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; නැගෙනහිරට : තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : මෙහි ලොට් Y මගින් ද සහ බස්නාහිරට: මෙහි ලොට් Y සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C (පාර) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් හයක (පර්. 6) *හෙවත්* හෙක්ටෙයාර් 0.015176ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ. පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ජාවත්ත ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, කොට්ඨාස අංක 40 තුළ, තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. විජයරත්නම් විසින් 1976.02.29 වැනි දින පිළියෙල කරන ලද අංක 9/1976 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් A2 වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්: උතුරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A1 මගින් ද; නැගෙනහිරට : ලොට් A1 සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : තිඹිරිගස්යාය පාරේ,

වරිපනම් අංක 19 දරන පරිශ්‍රය සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි පහක (පර්. 17.65) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව E 36/121 යටතේ ලියාපදිංචි කර ඇත.

වඩා මෑත නැවත මැනීමකට අනුව එකී ඉඩම පහත පරිදි විස්තර වේ.

ඉහත කී පිටත ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 73/6 (කොටස) දරන ස්ථානයේ පිහිටි "ගල්වලේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ක්‍රිෂ්ණපිල්ලෙයි විසින් 2013.08.15 වැනි දින පිළියෙල කරන ලද අංක 3314 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් Y වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් X මගින් ද; නැගෙනහිරට: මෙහි ලොට් X සහ තිඹිරිගස්යාය පටුමගේ, වරිපනම් අංක G27 දරන පරිශ්‍රය මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය සහ එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C(පාර) මගින් ද මායිම් වූ පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම හයයි පහක (පර්. 17.65) *හෙවත්* හෙක්ටෙයාර් 0.044642 ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වේ.

පහත දැක්වෙන පාර මතින් මාර්ග අයිතිය සමග වේ.

ඉහත කී කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහනගර සභා සීමා ඇතුළත තිඹිරිගස්යාය පිහිටි තිඹිරිගස්යාය, ඩී. එස්. ෆොන්සේකා පාරේ, වරිපනම් අංක 31 දරන ස්ථානයේ ඉඩමේ කොටසක් වන ඉහත කී අංක 9/1976 දරන පිඹුරේ ලොට් C වශයෙන් දැක්වෙන එකී ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මහනගර සභා කාණුව මගින් ද; නැගෙනහිරට : එකී අංක 9/1976 දරන පිඹුරේ ලොට් A1 සහ A2 මගින් ද; දකුණට : තිඹිරිගස්යාය පාරේ, වරිපනම් අංක 19 දරන පරිශ්‍රය මගින් ද සහ බස්නාහිරට : ඩී. එස්. ෆොන්සේකා පාර මගින් ද මායිම් වූ එකී අංක 9/1976 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහයි දශම දෙකයි බිංදුව (පර්. 5.20)ක විශාලත්වයෙන් වූ ඉඩම වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 36/122 යටතේ ලියාපදිංචි කර ඇත.

2025 ජූලි මස 30 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

09-103

**ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2024 අප්‍රේල් මස 25 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 08 වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී නමට අංක 00060039057 දරන හිමිකම් සහතිකය මත ප්‍රසිද්ධ නොතාරිස් ඊ. එම්. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද 2019.06.20 දිනැති සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. පී. එන්. වාසනා විසින් ලියා සහතික කරන ලද 2021.04.28 සහ 2023.08.14 දිනැති උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කේ. පී. එන්. වාසනා විසින් ලියා සහතික කරන ලද 2023.08.14 දිනැති අංක 1474 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම, වත්තල, නෝර්වුඩ් ෆැෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා *හෙවත්* කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් ජෙරාඩ් පෙරේරා විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2024 පෙබරවාරි මස 29 වැනි දිනට එකී නෝර්වුඩ් ෆැෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා *හෙවත්* කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් ජෙරාඩ් පෙරේරා ගෙන් ඩීඑෆ්සීසී බැංක් පීඑල්සී වෙත ඉහත කී අංක 00060039057 දරන හිමිකම් සහතිකය මත වූ උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් සහ අංක 1474 දරන උකස් බැඳුම්කරය මත ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් විසිපන් ලක්ෂ හැට පන් දහස් අටසිය අනූ නවයයි ශත හැත්තෑ හතක (ඇ.එ.ජ.ඩො. 2,565,899.77) මුදලක් ද, 2024 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් පන් ලක්ෂ දස දහස් අටසිය හතළිහයි ශත අනූ අටක (ඇ.එ.ජ.ඩො. 510,840.98) මුදල මත, රිෆිනිට් (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR - Security Overnight Financing Rate) ට ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොළිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ එක් දහස් තුන්සිය තිස් නවයයි ශත විසි නවයක (ඇ.එ.ජ.ඩො. 301,339.29) මුදල මත රිෆිනිට් (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල

වැඩකරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR) ට ඉහළින් වර්ෂයට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දස ලක්ෂ අනූ හය දහස් අටසිය තිහයි ශත හතක (ඇ.එ.ජ.ඩො. 1,096,830.07) මුදල මත රිෆිනිටි (Refinitiy) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR) ට ඉහළින් වර්ෂයකට සියයට දහ තුනක් (13%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ අසූ තුන් දහස් නවසිය අනූ අටයි ශත තිස් හතක (ඇ.එ.ජ.ඩො. 383,998.37)ක මුදල මත වර්ෂයකට සියයට දහයක් (10%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් විසි පන් ලක්ෂ හැට පන් දහස් අටසිය අනූ නවයයි ශත හැත්තෑ හතක (ඇ.එ.ජ.ඩො. 2,565,899.77) මුදලක් ද, 2024 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් පන් ලක්ෂ දහ දහස් අටසිය හතළිහයි ශත අනූ අටක (ඇ.එ.ජ.ඩො. 510,840.98) මුදල මත, රිෆිනිටි (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි, අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR - Security Overnight Financing Rate) ට ඉහළින් වර්ෂයකට සියයට හයයි දශම දෙකයි පහක් (6.25%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ එක් දහස් තුන්සිය තිස් නවයයි ශත විසි නවයක (ඇ.එ.ජ.ඩො. 301,339.29) මුදල මත රිෆිනිටි (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR) ට ඉහළින් වර්ෂයකට සියයට හතයි දශම පහක් (7.5%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දස ලක්ෂ අනූ හය දහස් අටසිය තිහයි ශත හතක (ඇ.එ.ජ.ඩො. 1,096,830.07) මුදල මත රිෆිනිටි (Refinity) මත ප්‍රසිද්ධ කළ අනුපාතයේ සඳහන් නියමයන් පරිදි අදාළ කරගනු ලබන, සෑම වර්ෂයකම ජනවාරි, අප්‍රේල්, ජූලි හා ඔක්තෝබර් යන මාසවල වැඩ කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන සුරක්ෂිත එක්දින මූල්‍ය අනුපාතිකය (SOFR) ට ඉහළින් වර්ෂයකට සියයට දහ තුනක් (13%) බැගින් වූ අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් තුන් ලක්ෂ අසූ තුන් දහස් නවසිය අනූ අටයි ශත තිස් හතක (ඇ.එ.ජ.ඩො. 383,998.37)ක මුදල මත වර්ෂයකට සියයට දහයක් (10%) බැගින් වූ ස්ථිර අනුපාතය මත ගණනය කරනු ලබන පොලිය ද හෝ විකිණීමේ අවස්ථා දක්වා එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් අයකර ගැනීම සඳහා එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ උකස් බැඳුම්කරයන්ගේ ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු අය අනෙකුත් අය කිරීම් ද අයකර ගැනීම සඳහා ඉහත කී අංක 00060039057 දරන හිමිකම් සහතිකය මත වූ සාධන පත්‍රයන් මගින් කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා *හෙවත්* කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් ජෙරාඩ් පෙරේරා විසින් සහ අංක 1474 දරන උකස් බැඳුම්කරය මගින් කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් පෙරේරා *හෙවත්* කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් ජෙරාඩ් පෙරේරා ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරනු ලබන ඉඩම, ගොඩනැගිල්ල සහ තොග බලයලත් වෙන්දේසිකරු තුසිත් කරුණාරත්න ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

**2019.06.20, 2021.04.28 සහ 2023.08.14 දිනැති අංක 00060039057 දරන හිමිකම් සහතිකය මත වූ උකස් කිරීම සඳහා වූ සාධන පත්‍රයන් මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

| | |
|---|---|
| පළාත | : බස්නාහිර |
| දිස්ත්‍රික්කය | : ගම්පහ |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : වත්තල |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : 176, වත්තල. |
| ගම | : වත්තල |
| වරිපනම් අංකය | : - |
| කැඩැස්තර සිතියම් අංකය | : 512000 |
| කොට්ඨාස (Block) අංකය | : 03 |
| කොටස් (Parcel) අංකය | : 0080 |
| වර්ග ප්‍රමාණය | : හෙක්ටයාර 0.049 |

**අංක 1474 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය**

නොර්වුඩ් ෆැෂන්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් හි තොග වෙළෙඳ භාණ්ඩ සහ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ ඇතුළත්ව සම්පූර්ණයෙන් ම -

| *තොග විස්තරය* | *[Description of Stocks]* |
|---|---|
| නිමි භාණ්ඩ | [Finish Goods] |
| රෙදි | [Fabric] |
| කෙරීගෙන යන වැඩ | [Work in progress] |
| ප්‍රවාහනය කෙරෙමින් පවතින භාණ්ඩ | [Goods in Transit] |

සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ වුව ද සෑම විස්තර සහ කාණ්ඩයකම අනෙක් චංචල දේපළ, ශ්‍රී ලංකා ජනරජයේ වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල අපනයන සැකසුම් කලාපයේ ලොට් 13A සහ 13B දරන පරිශ්‍රයන්ය හි දැනට තබා තිබෙන සහ ගබඩා කර ඇති සහ යම් අවස්ථාවක හා කලින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ තබා තිබෙන යම් අවස්ථාවක හා කළින් කල ගබඩා කර හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක් තුළ හෝ මත දැනට තිබෙන සම - ණය ගැණුම්කරුවන්ගේ තොග වෙළෙඳ භාණ්ඩ, අමුද්‍රව්‍ය, කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ, නොනිමි භාණ්ඩ සහ අනෙකුත් සියලු අයිතමයන් සහ වෙනත් චංචල දේපළ සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුවද වෙනත් චංචල දේපළ කළින් කළ හා සෑම කල්හිම ගබඩා කර තබනු ලැබිය හැකි පරිශ්‍රයක තිබෙන සෑම ආකාරයකම හා සියලු විස්තරවලට අයත්වන තොග වෙළෙඳ භාණ්ඩ, අමුද්‍රව්‍ය, කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුව ද වෙනත් චංචල දේපළ සහ මින්මතු මෙම ලියවිල්ල බලාත්මකව පවත්නා කාල ඇතුළත සහ සෑම කල්හිම වරින්වර එකී පරිශ්‍රයට ගෙන එනු ලැබිය හැකි හෝ ඒ පරිශ්‍රයක තබා තිබිය යුතු හා තිබිය හැකි තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුව ද වෙනත් චංචල දේපළ සහ සම - ණයගැණුම්කරුවන් විසින් මින් මතු යම් අවස්ථාවක සහ වරින්වර එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය හෝ ගබඩාවට ගෙනයනු ලැබිය හැකි සහ නැව්ගත කිරීමේ අපේක්ෂාවෙන් හෝ සාප්පුවේ දී හෝ ගබඩාවේ දී නිශ්කාෂණය කිරීමේ අපේක්ෂාවෙන් එකී ජනරජයේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ව්‍යාපාර ස්ථානවලට හෝ ව්‍යාපාර ස්ථානයකට හෝ ගෙන එනු ලැබිය හැකි, එකී තොග වෙළෙඳ භාණ්ඩ අමුද්‍රව්‍ය කෙරීගෙන යන වැඩ නිමි භාණ්ඩ සහ නොනිමි භාණ්ඩ සහ චංචල දේපළ සහ අනෙකුත් සියලුම අයිතමයන් සහ කවරාකාරයේ හෝ ස්වභාවයේ වුව ද වෙනත් චංචල දේපළ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්,
ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී.

09-124